සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** **தரம் 07**
**Third Term Test 2017** **Grade 07**

**බුද්ධ ධර්මය - I කොටස**

**පැය දෙකයි**
***Two hours***

- **එක් එක් ප්‍රශ්නයට අදළ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සිදුහත් බෝසතාණෝ සම්මා සම්බුද්ධත්වයට පත් වූයේ,
    1. පොසොන් පොහෝද ය.
    2. වෙසක් පොහෝදය.
    3. දුරුතු පොහෝදය.

2. බුදුරජාණන් වහන්සේ සත්වන සතිය ගත කළේ,
    1. කිරිපලු නුගරුක මුලය.
    2. ශ්‍රී මහා බෝධිය මුලය.
    3. අජපාල නුගරුක මුලය.

3. මධ්‍යම ප්‍රතිපදවේ නිවැරදි යහපත් උත්සාහය හඳුන්වන්නේ,
    1. සම්මා ආජීවයයි.
    2. සම්මා කම්මන්තියි.
    3. සම්මා වායාමයයි.

4. මිහිඳු හිමියන්ගේ ලංකාගමනය සිදු වූයේ,
    1. වෙසක් පොහෝදය
    2. පොසොන් පොහෝදය
    3. ඇසළ පොහෝදය

5. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් සදිසා නමස්කාරයට අනුව ගුරු සිසු සබඳතාවය දැක්වෙන දිශාව වනුයේ,
    1. නැගෙනහිර දිශාවටය
    2. උතුරු දිශාවටය
    3. දකුණු දිශාවටය

6. ත්‍රිශික්ෂාවෙහි “පඤ්ඤා” යන්න වන්නේ,

    1. සම්මා දිට්ඨි හා සම්මා සංකප්පයයි.
    2. සම්මා දිට්ඨි හා සම්මා වායාමයයි.
    3. සම්මා කම්මන්ත හා සම්මා සංකප්පයටයි.

7. තම ශරීරයට අධික ලෙස දුක්දීම හඳුවන්නේ,

    1. කාම සුඛල්ලිකානු යෝගයයි.
    2. අත්ථකිල මතානුයෝගයයි.
    3. කාම මිච්ඡාචාරයයි.

8. ඍතු අනුව ලෝකය හා පුද්ගල ජීවිතයේ ඇතිවන වෙනස්කම් හඳුන්වනුයේ,

    1. උතු නියාමයයි.
    2. බීජ  නියාමයයි.
    3. කම්ම නියාමයයි.

9. සිංහලයේ දෙවන මහා කව ලෙස හඳුන්වන්නේ,

    1. ලෝවැඩ සඟරාවයි.
    2. සිරිත් මල්දමයි.
    3. කාව්‍යශේඛරයයි.

10. අප පන්සලේදී ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන අනුපිළිවෙළ වන්නේ,

    1. උද්දේසික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය
    2. ශාරීරික චෛත්‍යය, පාරිභෝගික චෛත්‍යය, උද්දේසික චෛත්‍යය
    3. පාරිභෝගික චෛත්‍යය, ශාරීරික චෛත්‍යය, උද්දේසික චෛත්‍යය

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශයන් හරි නම් (✔) ලකුණද වැරදි නම් (X) ලකුණද යොදන්න.**

11. දන්දීම යනු දස වැදෑරුම් වස්තු පූජා කිරීමයි. (..........)

12. අපණ්ණක ජාතක කතාවෙන් කළගුණ සැලකීමේ ගුණය ප්‍රකට වේ. (..........)

13. නිවැරදි යහපත් සිහිය සම්මා සති ලෙස හඳුන්වයි. (..........)

14. ධම්ම පදය තුළ ගාථා 550 ක් ඇතුළත් වේ. (..........)

15. තෘෂ්ණාව කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ලෙස තුන් ආකාර වේ. (..........)

- **16 සිට 20 දක්වා ඇති වගන්තිවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා වගන්ති සම්පූර්ණ කරන්න.**

16. ආර්ථිකය නිවැරදිව කළමණාකරනය කර ගන්නා තැනැත්තා ............................................ ලෙස හඳුන්වයි.

17. ගංගා, යමුනා, අචිරවතී, සරසභූ ............................................ යන ගංගා පංචමහා ගංගා ලෙස නම් කල හැකිය.

18. අනේපිඬු සිටුතුමා ............................................ පූජාකරන ලදී.

19. පළමු ආරාම පූජාව වන්නේ ............................................ යි.

20. නිති පන්සිල් පොහොය ............................................ ලෙස සඳහන් වේ.

( මහී, ජේතවනාරාමය, වේළුවනාරාමය, තුලාධාරික, අටසිල් )

( ලකුණු 2 X 20 = 40 )

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** — **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** — **தரம் 07**
**Third Term Test 2017** — **Grade 07**

**බුද්ධ ධර්මය - II කොටස**

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

(01) (i) බුද්ධ ශාසනයේ අගසව් දෙදෙනා නම් කරන්න.

(ii) ත්‍රිශික්ෂා නම් කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා ලියන්න.

(iv) අත්තූපනායික ධර්ම පරියාය යන්න හඳුන්වන්න.

(v) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය නම් කරන්න.

(vi) සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ භාවිතාවන විශේෂ ශාසනික ව්‍යවහාර 2ක් ලියන්න.

(vii) ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙළින් ලියන්න.

(viii) බුදු දහමේ ඉගැන්වෙන අධිපති ධර්ම නම් කරන්න.

(ix) උදුම්බරබාදිකයන් ලෙස හඳුන්වන්නේ කුමන පුද්ගලයින්ද?

(x) නියාම ධර්ම නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) චතුරාර්ය සත්‍ය නම් කරන්න. ( ලකුණු 2 )

(ii) එහි අර්ථය ලියන්න. ( ලකුණු 3 )

(iii) ප්‍රායෝගික ගැටළු විසඳාගැනීමට චතුරාර්ය සත්‍යය යොදා ගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 5 )

(03) (i) සත් සතිය පිළිවෙලින් නම් කරන්න. ( ලකුණු 2 )

(ii) පළමු රහත් හැට නම සකස් වූ ආකාරය ලියන්න. ( ලකුණු 3 )

(iii) බුදු රජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

( ලකුණු 5 )

(04) (i) අසවලා මට බැන්නේය. මට පහර දුන්නේය. මා පරාජය කළේය. මා සතු දෙය පැහැර ගත්තේය. යනුවෙන් යම් අය නැවත නැවත නොසිතත් නම්, ඔවුන්ගේ වෛරය සන්සිඳේ. අදහසට අදාළ ගාථාව ලියන්න. ( ලකුණු 2 )

(ii) එම ගාථාව අදාළ වග්ගය කුමක්ද? ( ලකුණු 3 )

(iii) ධම්ම පදයෙන් අපේ ජීවිතයට ගත හැකි ආදර්ශය කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(05) (i) "සමජීවිකතාව" යන්න හඳුන්වන්න. ( ලකුණු 2 )

(ii) සිඟාලෝවාද සූත්‍රයට අනුව ධනය පරිහරණය කලයුතු ආකාරය කෙටියෙන් ලියන්න. ( ලකුණු 3 )

(iii) පාසල් දරුවෙකු ලෙස ඔබ සම්පත් අරපිරිමැස්මෙන් යුතුව පරිහරණයට ගන්නා ආකාරය පැහැදිලි කරන්න. ( ලකුණු 5 )

(06) (i) සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කළේ කුමන පොහොය දිනකද ? ( ලකුණු 2 )

(ii) ශ්‍රී ලංකාවට මිහිඳු හිමියන් සමග පැමිණි පිරිස නම් කරන්න. ( ලකුණු 3 )

(iii) මහින්දාගමනයෙන් ලද දායාද පිළිබඳ විස්තර කරන්න. ( ලකුණු 5 )

(07) පහත සඳහන් මාතෘකා අතුරින් 2 ක් තෝරාගෙන කෙටි විස්තරයක් ලියන්න.

(1) දස පුණ්‍ය ක්‍රියා
(3) මහින්දාගමනය
(2) අනේපිඬු සිටුතුමා
(4) සිරිත් විරිත්

(ලකුණු 5 x 2 = 10 )